දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :07/2024

මගේ අංක- සමු/අයි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප),
ආදිපාද වීදිය, කොළඹ 01.
2024.09.25

බස්නාහිර පළාත් සියළුම විවිධ සේවා සමුපකාර සමිති, මුල්‍ය සේවා සමුපකාර සමිති සහ සමුපකාර සංගම්වල ගරු සභාපතිවරුන් වෙත.

<u>ප්‍රාථමික හා ද්විතික සමුපකාර සමිති හා සංගම් විසින් ආයෝජන කටයුතු කිරිම.</u>

සමුපකාර ග්‍රාමීය බැංකු හා මුල්‍ය සේවා සමුපකාර සමිති/සංගම් සඳහා සුදුසු ආයෝජන කළඹ හා ආයෝජන සිදු කිරිමේ ක්‍රියා පටිපාටි මාගේ 2024.05.15 දිනැති 01/2024 අංක දරණ චක්‍ර ලේඛය මගින් හඳුන්වා දී ඇත.එම චක්‍ර ලේඛනයේ මඟ පෙන්වීම් වලට අමතරව මෙම චක්‍ර ලේඛය මගින් උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙයි.

02.) සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 41(1) වගන්තිය අනුව ආයෝජන සිදු කල යුතු බවට නෛතික විධිවිධාන පනවා ඇත.එම විධිවිධාන වලට පටහැනිව ඇතැම් සමුපකාර සමිති කටයුතු කරන බව නිරීක්ෂණය කරමි.

03.) නිත්‍යානුකුල නොවන අයුරින් සහ අවදානම් සහගතව ආයෝජන සිදු කිරිම තුලින් මහජන තැන්පතු බරපතල ලෙස අවදානමට ලක් කර ඇති බව මෑත කාලීනව සමුපකාර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය අධ්‍යානය කල විට පැහැදිලි වේ.සමුපකාර සමිතියක් ලෙස ලියාපදිංචි කිරිම සමඟ සමුපකාර සමිතිවලට මහජන තැන්පත් රැස්කිරිමට නෛතික හිමිකමක් ලැබි ඇත.එකී තැන්පත් මුදල් අනීතික ලෙස හා අවදානම් සහගත ලෙස ආයෝජනය කිරිම සමිතියට ලැබී ඇති ඉහත සඳහන් නෛතික හිමිකම අවභාවිතා කිරීමක් බව දැඩි ලෙස අවධාරණය කරමි.

04.) ඇතැම් සමුපකාර සමිති ඉල්ලුම් තැන්පත් හා කාලීන තැන්පත් ලෙස රැස්කල මුදල් විවිධ ආයතනවල කොටස් මුදල් වශයෙන් (ප්‍රාග්ධනය ලෙස) ආයෝජනය කර ඇති බව මා වෙත වාර්තා වී ඇත.කොටස් මුදල් සඳහා ලාභාංශ හිමිවනුයේ අදාල ආයතන ලාභදායි වුවහොත් ඊට අනුපාතික වශයෙනි. නමුත් එහි ආයෝජන සඳහා තැන්පත් භාවිතා කර ඇති සමිති විසින් රැස් කරගත් තැන්පත් මුදල් සඳහා නියමිත අනුපාතයකට නියමිත කාලයකට අදාලව ආයෝජනය පොලී මුදල් ගෙවිය යුතුය. ඒ අනුව මෙම සාධකය මත සමිතිවල මුල්‍ය අර්බුද ඇති වීම ප්‍රවනතාවක් මතු වී ඇත.එම නිසා කිසිදු අවස්ථාවක තැන්පත් වශයෙන් රැස් කරන මුදල් කොටස් මිලදී ගැනිම සඳහා ආයෝජනය නොකල යුතු බව අවධාරණය කරමි.

05.) මේ වන විට සමුපකාර සමිති ඉහත සඳහන් ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් හා අවදානම් සහගත ලෙස සිදුකර ඇති සියළු ආයෝජනවලට අදාල මුදල් මාසයක් ඇතුලත ලබා ගැනීමට කටයුතු කල යුතුය. යම් අයෝජනයක් අනිතික හා/හෝ අවදානම් සහිත නම් කුමන හේතුවක් මත හෝ තව දුරටත් එකි ආයෝජනය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම තුල වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව තවදුරටත් අවදානමකට ලක්වන බැවින් අදාල ආයෝජන ආපසු ලබා ගැනිම කාර්යය මාසයක් ඇතුලත අවසන් කල යුතු බව වැඩිදුරටත් දන්වමි. ඒ අයුරින් මුදල් ලබා ගැනීමට නොහැකි වන්නේ නම් එකි මුදල් ලබා ගැනීම සඳහා සමුපකාර නීතිය යටතේ හෝ පොදු නීතිය යටතේ අදාල වන පරිදි එන්තරවාසි නිකුත් කර අයකර ගැනීමට පියවර ගත යුතු බවද දන්වමි.

**06.)** යම් සමිතියක් අනිතික ආයෝජන හා/හෝ අවදානම සහිත ආයෝජන නිසා සමිතියට අයවිය යුතු මුදල් ඉහත දන්වා ඇති පරිදි කටයුතු සිදුකර අයකර ගැනීමට නොහැකි වන්නේ නම් අදාල මුදල් ආයෝජනය සිදු කිරිමට අදාල තීරණය ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල/ කාරක සභාව වෙතින් සමුපකාර නීතිය යටතේ අයකර ගැනීමට වර්තමාන කාරක සභාව පියවර ගත යුතුය.

**07.)** යම් අධ්‍යක්ෂ මණ්ඩලයක්/ කාරක සභාවක් ඉහත සඳහන් උපදෙස් හා නියෝගවලට එකඟ නොවන අයුරින් කටයුතු කිරිම නිසා සමිතියට ඇතිවන අලාභයකය පාඩුවකට හෝ සමිතිය යටත් වන දඬුවමකට තනි තනිව හා සාමුහිකව වගකිමට බැදෙන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එම්. ඒ. පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

පිටපත් :

| | | | |
|---|---|---|---|
| i. | ලේකම් ,සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය | - | කරු.දැ.පි. |
| ii. | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ( කොළඹ/ගම්පහ/කළුතර) | - | කරු.දැ.පි.හා අදාළ නිළධාරීන් හා දිස්ත්‍රික්කයේ සියළු සමුපකාර සමිති දැනුවත් කිරීමට හා ප්‍රගතිය පරික්ෂා කර වාර්තා කිරීමට |